ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

ඉඩම් මහලේකම් කාර්යාලය,
නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2864051
ඊමේල් / ஈ-மெயில் / E-mail: info@landcomdept.gov.lk

මගේ අංකය / எனது இல / MY NO: 5/2/6/රන්බිම චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / YOUR NO:
දිනය / திகதி / DATE: 2013.10. 31

චක්‍රලේඛ අංක 2013/02

22 NOV 2013

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු,

සියළුම නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්),

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති අවසරපත්‍ර සඳහා දීමනාපත්‍ර සකස් කිරීම</u>

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රන්බිම දීමනාපත්‍ර ලබා දීමේදී ඊට අනුකූලව නිකුත් කර ඇති බලපත්‍රයේ දැක්වෙන ඉඩමේ ප්‍රමාණය සහ දීමනාපත්‍රය සඳහා සකස් කරන රේඛාචිත්‍රයේ දැක්වෙන ප්‍රමාණය එකිනෙකට නොගැළපෙන අවස්ථා බොහොමයක් ඇති බව හඳුනාගෙන ඇත.

මෙම දෝෂය නිසා දීමනාපත්‍ර සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වන අතර මා වෙත ලැබෙන ඉල්ලීම් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ආපසු හරවා යැවීමටද සිදුවේ. මෙම තත්ත්වය යටතේ දීමනාපත්‍ර සකස් කිරීමේදී නිශ්චිත පොදු ප්‍රතිපත්තියක් මත ක්‍රියා කිරීම සුදුසු බව හැඟී යන බැවින් පහත සඳහන් පරිදි කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටින අතර ඒ අනුව ඔබගේ කාර්ය මණ්ඩලය දැනුවත්කර මින් ඉදිරියට අඩුපාඩු රහිතව දීමනාපත්‍ර සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු එවීමට පියවර ගන්න.

01. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා වැඩි වන අවස්ථා වලදී, පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුයි.

I. භුක්ති විඳින ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% නොඉක්මවන අවස්ථාවලදී, එම වෙනස පර්චස් 10කට වඩා වැඩි නොවේනම්, භුක්ති විඳින ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස්කළ යුතු වේ.

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණ අතර වෙනස 10% නොඉක්මවයිනම්, එම වෙනස පර්චස් 10කට වඩා වැඩි වේනම්, එම වැඩිවන ඉඩම් ප්‍රමාණය වෙනම බිම් කැබැල්ලක් ලෙස වෙන් කළ යුතු අතර බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රයක් සකස් කළ යුතු වේ.

III. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% ඉක්මවන අවස්ථා වලදී බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට රේඛා චිත්‍රය ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතු වේ. එහෙත් මෙම වැඩි වූ බිම් ප්‍රමාණය ඉඩම පිහිටි පළාත් පාලන බල ප්‍රදේශයේ අවම බෙදුම් සීමාවට වඩා අඩු වේ නම් භුක්ති විඳින ප්‍රමාණයටම දීමනාපත්‍රය සකස් කළ හැකිය.

කාර්යාලය / பொது: 011-2797400 · ආයතන / நிர்வாகம்: 011-2797413 · ගිණුම් / கணக்கு: 011-875833 · ඉඩම් / காணி: 011-875834 · සංවර්ධන / அபிவிருத்தி: 011-2874025

02. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථා වලදී, පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුයි.

I. භුක්ති විඳින ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% නොඉක්මවන අවස්ථාවලදී, භුක්ති වඳින ඉඩම් ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතුවේ.

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% වඩා වැඩි වේ නම් භුක්ති විඳින ප්‍රමාණයට බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය සංශෝධනය කළ යුතු වේ. ඒ සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ පළාත් ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අනුමැතියක් ගෙන බලපත්‍රයේ අදාළ සංශෝධන ඔබ විසින් සිදු කර භුක්ති විඳින ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතුවේ.

03. වාරි පහසුකම් සහිත මඩ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඉහත උපදේශයන්ට අමතරව පහත සඳහන් කරුණු කෙරෙහිද සැලකිල්ලක් දැක්විය යුතු යි.

I. භුක්ති විඳින ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථා වලදී එම ඉඩම සඳහා නිශ්චිත ජල සැපයුමක් තිබේ නම් පමණක් භුක්ති විඳින ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රයක් සකස් කළ යුතු වේ.

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩිවන අවස්ථා වලදී එම වැඩිවන ප්‍රමාණය රූඩ් 02කට වඩා අඩු වේ නම් භුක්ති විඳින ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රයක් සකස් කළ යුතු වේ.

III. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩිවන අවස්ථා වලදී එම වැඩිවන ප්‍රමාණය රූඩ් 02 කට වඩා වැඩි වේ නම් බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට පමණක් රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රයක් සකස් කළ යුතු වේ. එසේ වැඩිවන බිම් ප්‍රමාණය වෙන් කර මැනීමට කටයුතු කළ යුතු අතර එම බිම් ප්‍රමාණය සඳහා නිශ්චිත ජල පහසුකමක් ලබාගත හැකිවන පරිදි මැනුම් කිරීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම කටයුතු කළයුතු වේ.

මෙම උපදෙස්වලට පටහැනි ආකාරයෙන් රේඛාචිත්‍ර සකස් කර ඇති අවස්ථාවලදී, නැවත මැණුම් ඉල්ලීම් යවා එම රේඛාචිත්‍ර නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වේ.

ඉහත උපදෙස් පිළිපැදීමේදී යම් ගැටළුවක් මතු වේ නම් ඒ සම්බන්ධයෙන් මා අමතන ලෙස වැඩිදුරටත් දන්වමි.

කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව දැනුම් දෙන්න.

ආර්.පී.ආර්.රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් -

1. ලේකම් - ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. මැනුම්පති - මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කරු. මෙම උපදෙස් අනුව කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කිරීම සඳහා